# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2342/21 – 2023 ජූලි මස 25 වැනි අඟහරුවාදා – 2023.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

2023 අංක 118 දරන ආඥාව

මගේ යොමු අංකය : 4-3/18/2021/WS/65.
ප්‍රා.ලේ. ගේ යොමු අංකය: 3/3/10/2/45.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ජුනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' ,
අංක. 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, උකුවෙල.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හලංගොඩ (ඊ347ඒ) සහ බලකඩුව (ඊ357ඩී), ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හලංගෙ ාඩ සහ බලකඩුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/UK /2021/420 හා 2022.04.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' - ඉඩමේ නම - බටකොටුවේ හේන - ප්‍රමාණය: හෙක්. 0.0037**

උතුරට: මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය සහ එච්.ඒ. ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන; නැගෙනහිරට: එච්.ඒ. ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන සහ බලකඩුව ඔය;දකුණට: බලකඩුව ඔය සහ එච්.ඒ. ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන; බටහිරට: එච්.ඒ. ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන සහ මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය.

**02. කැබලි අක්ෂර 'B' -ඉඩමේ නම - ඇටඹගහමුලවත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0026**

උතුරටඃ බලකඩුව ඔය සහ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුලවත්ත; නැගෙනහිරටඃ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුලවත්ත සහ මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය; දකුණටඃ මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය සහ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුලවත්ත ; බටහිරටඃ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුලවත්ත සහ බලකඩුව ඔය.

EOG 07-0237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.